**ශීර්ෂය128 - සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

## 1.1 විගණන විෂය පථය

සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 03 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හි හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විසර්ජන ගිණුම**

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,094,579,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.947,760,639 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.146,818,361 ක් හෙවත් සියයට 13 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 574,579,000 | 569,738,669 | 4,840,331 | 0.8 |
| මූලධන | 520,000,000 | 378,021,970 | 141,978,030 | 27.3 |
| **එකතුව** | **1,094,579,000** | **947,760,639** | **146,818,361** | **13.4** |

**(ii) අයවැය විචලනය**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

- වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.5,550,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

- වැය විෂයයන් 19 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 12801 | 6,500,000 | 5,067,815 | 2,500,000 | 5,211,090 | 23,000,000 | 12,790,305 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 12801 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.223,053 ක් වූ අතර, වර්ෂ 05කට අධික කාලයක් ගත වී තිබුණත්එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ii) අමාත්‍යාංශය විසින් ණය ගෙවීමේදී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර රු.15,000 ක ණය ගෙවා තිබුණි.

**1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අභ්‍යන්තර විගණනය**

අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, එහි පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර 2011 මැයි 08 දින සිට විගණිත දිනය වූ 2014 මැයි 31 දින දක්වා වර්ෂ 03කට අධික කාලයක් තිස්සේ පුරප්පාඩු වී පැවතුණු අතර අමාත්‍යාංශය විසින් ඉල්ලීම් කර තිබුණද, 2014 මැයි 31 දින වන විටත් එම තනතුරට නිලධාරියෙකු පත් කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර, 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයට අනුකූලව අභ්‍යන්තර විගණනය සිදුකර නොතිබුණි.

**1.5 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය විසින් රු.මිලියන 3.5 ක් වටිනා මෝටර් වාහන 02 ක් පිළිවෙලින් 2012 ජුනි 17 දින හා 2012 සැප්තැම්බර් 13 දින අවිධිමත් ලෙස රාජ්‍ය සමාගමක් වෙත මුදාහැර තිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වනිතා කටයුතු අමාත්‍යාංශයට අයත්ව තිබුණු රු.මිලියන 2ක් වටිනා මෝටර් වාහනයක් අමාත්‍යාංශය විසින් 2010 මැයි 01 දින සිට විධිමත් අනුමැතියකින් තොරව භාවිතයට ගෙන තිබුණි.

## 1.6 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.**

සමාලෝචිත වර්ෂය තුළ සිදු වූ අලාභවලින් රු.107,787 කට ඇස්තමේන්තු කර තිබුණු අලාභහානි මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව කටයුතු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර හෝ පොත්වලින් කපා හැරීමට හෝ 2014 මාර්තු 31 දින වන විටද, අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි

## 1.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්**

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ මැටි ආශ්‍රිත නිෂ්පාදන ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු.1,365,000 ක වියදමින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත පන්සලගොඩ නිෂ්පාදන ගම්මානය සංවර්ධනය කිරීමට සැලැසුම් කර තිබුණද එම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි.

**(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

2012 වර්ෂයේදී රු.මිලියන 220 ක ඉන්දියානු මූල්‍යාධාර හා රු.මිලියන 50 ක දේශීය අරමුදල් සළසා අච්චුවේලි කාර්මික ජනපදය ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. එම ව්‍යාපෘතිය 2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2013 අගෝස්තු මාසයේදී නිම කිරීමට සැලැසුම් කර තිබුණද, ව්‍යාපෘතියේ කටයුතු වර්ෂයක ප්‍රමාදයකින් පසුව 2014 අගෝස්තු 27 දින නිම කර කාර්මික ජනපදය විවෘත කර තිබුණි.

## 1.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අමාත්‍යාංශය විසින් මිලට ගෙන කුරුණෑගල කලාප කාර්යාලය වෙත ලබාදී තිබුණු ඉන්වෙන්ට්‍රි භාණ්ඩවලින් වැඩි ප්‍රමාණයක් කිසිදු නීත්‍යානුකූල පැවරීමකින් තොරව වෙනත් අමාත්‍යාංශයක් විසින් පරිහරණය කර තිබුණි. එම හේතුව නිසා අමාත්‍යාංශය සතු ඉන්වෙන්ට්‍රි භාණ්ඩවල අයිතිය හා ආරක්ෂාව පිළිබඳව ගැටළු සහගත වී තිබුණි.

**1.9 පාඩු හා හානි**

2012 අගෝස්තු 21 දින මෝටර් රථයක් අනතුරකට භාජනය වීම හේතුවෙන් දැරීමට සිදුවූ මුළු වියදමින් රු.156,832 ක මුදලක් ගෙවීම රක්ෂණයෙන් ප්‍රතික්ෂේප කර තිබුණි. මෙම අනතුර සම්බන්ධ වාහනයට අනුයුක්ත කර සිටි රියදුරු ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිලධාරියෙකු වූ අතර අදාල අලාභයෙන් සියයට 50ක් පමණක් වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු යොදා තිබුණි.

**1.10 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 11 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 01 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 396 | 310 | 86 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 31 | 24 | 07 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 05 | 05 | - |
| | එකතුව | 451 | 351 | 100 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 100 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| සංවර්ධන සහකාර | 01 | ජනාධිපති කාර්ය සාධක බලකාය | 2009.05.27 දින සිට |
| -එම- | 01 | ප්‍රා.ලේ. කෑගල්ල | 2013.07.29 දින සිට |

(ඇ) **වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් මණ්ඩලයක රියදුරෙකු 2011 අප්‍රේල් සිට විගණිත දිනය වූ 2014 මැයි 31 දින දක්වා වර්ෂ 03කට අධික කාලයක් අවිධිමත් ලෙස සේවයේ යොදවා ගෙන තිබුණි.